---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.5.1** ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිමකළ ව්‍යාපෘති 14 කින් ලැබිය යුතු එකතු වටිනාකම වූ රු. 9,490,550 ක් 2020 මැයි 31 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති 14 තුළ ඇතුළත් 2019 වර්ෂයේදී නිම කරන ලද වටිනාකම රු. 940,350 ක් වූ ව්‍යාපෘති 02 ක රැඳවුම් මුදල් ද පැරණි ව්‍යාපෘති දෙකකින් ලැබිය යුතු මුදල රු.973,760 ක් හා රු.4,644,560 ක් වූ ව්‍යාපෘති 06 ක මුදල අය කරගැනීමට කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘති අවසන් වූ විගස ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,359,788 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,629,776 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,989,564 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමක් පරිපාලන වියදම් රු.30,342,983 කින් වැඩිවී තිබීම හා , වෙනත් ආදායම් රු.3,830,652 කින් අඩුවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කලමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යස්ථානය මඟින් හඳුන්වාදුන් තාක්ෂණයන් වෙනුවෙන් වර්ෂය තුල බලපත්‍ර 42 ක් ලබා දීම ඉලක්ක කර තිබුණද ලබා දී තිබුණු බලපත්‍ර ප්‍රමාණය 28 ක් | තාක්ෂණ පැවරීම් 42 සිදු කිරීමට අපේක්ෂා කල ද තාක්ෂණ ලබා ගැනීම සඳහා ඉදිරිපත් වූයේ ව්‍යවසායකයින් 28 දෙනෙකු පමණක් වන ව්‍යවසායකයින්ගෙන් ලැබුණු | ආයතනය විසින් හඳුනාගත් තාක්ෂණයන්, කලින් කලට වැඩිදියුණු කළ යුතු අතර, එම තාක්ෂණයන් |

| | | | |
|---|---|---|---|
| | පමණක් විය. ඉන් ලැබුණු ආදායම රු.166,582 කි. වර්ෂ ආරම්භයේදී බලපත්‍ර ලාභීන් 63 දෙනෙකු සිටි නමුත් වර්ෂය තුළ අළුත් කිරීමට ඉදිරිපත් වී තිබුණේ ඉන් බලපත්‍ර 28 ක් පමණි. ඉන් ලැබූ ආදායම රු.194,200 ක් විය. කෙසේ නමුත් මධ්‍යස්ථානයේ බලපත්‍ර ලබාදීම්, අළුත් කිරීම් රටාව විශ්ලේෂණය කිරීමේ දී හඳුන්වා දුන් තාක්ෂණයන් බොහොමයක් රටතුළ ප්‍රමාණවත් පරිදි ප්‍රචලිත වී නොමැති බව නිරීක්ෂණය විය. | ප්‍රතිචාරය ඉතාමත් අඩු මට්ටමක පැවතිණ. සමහර තාක්ෂණයන් දැනටමත් වලංගු කාලය ඉක්මවා ඇති බැවින් එම තාක්ෂණයන්ට අදාළ බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කිරීමට උනන්දු වී නොමැත. | සමාජගත කිරීමට කටයුතු කළ යුතු බව. එසේම බලපත්‍ර අළුත් කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව මධ්‍යස්ථානය විසින් වර්ෂය තුළ තාක්ෂණයන් 08 ක් හඳුන්වා දීම ඉලක්ක කර තිබුණත් හඳුන්වා දීමට හැකිව තිබුණේ පිරිවැය රු 2,449,157 ක් වූ තාක්ෂණ හා තාක්ෂණ උපකරණ 04 ක් පමණි. එම තාක්ෂණයන් සම්බන්ධයෙන්ද විගණිත දිනය වන විටත් පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට හැකිව තිබුණේ එක් උපකරණයක් සඳහා පමණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව තාක්ෂණයන් 08 ක් 2019 වර්ෂය තුළදී හඳුන්වා දීමට සැලසුම් කලත්, ඊට අදාල වන්නා වූ ව්‍යාපෘතීන් වර්ෂය තුළදී නිම කිරීමට නොහැකි වූයෙන් හඳුන්වාදීමට හැකි වූයේ තාක්ෂණයන් 04 ක් පමණි. පර්යේෂණ ව්‍යාපෘතීන් සැලසුම් කළ ආකාරයට නියමිත දිනයේදීම සාර්ථකව අවසන් කිරීම සැම විටම සිදු නොවේ. හඳුන්වාදෙන ලද තාක්ෂණයන් සඳහා තාක්ෂණ පැවරීම ඉදිරියේදී සිදු කිරීමට බලාපොරොත්තු වේ. | දිනෙන් දින නව තාක්ෂණයන් බිහිවන බැවින් ආරම්භ කළ ව්‍යාපෘති කාර්යක්ෂමව නිම කළ යුතු අතර තාක්ෂණ පැවරුම් කඩිනම් කල යුතු බව. |
| (ඇ) | 2010-2019 දක්වා තාක්ෂණයන් 47 ක් හඳුන්වා දී තිබුණද 2019 වර්ෂයේදී බලපත්‍ර ලබා ගැනීමට/ අළුත් කිරීමට ඉදිරිපත් වූයේ තාක්ෂණයන් 24 සඳහා පමණි. | වැඩි අවශ්‍යතාවයක් පවතින තාක්ෂණයන් සඳහා වැඩි උනන්දුවක් දක්වන බවයි. | ආයතනය විසින් හඳුනාගත් තාක්ෂණයන්, කලින් කලට වැඩිදියුණු කළ යුතු අතර, එම තාක්ෂණයන් සමාජගත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වයංක්‍රීය යෝගට් පිරවීමේ සහ මුද්‍රා තැබීමේ යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් 2017 පෙබරවාරි 01 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණු අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රු. 560,000 ක් විය. අදාල කාලය තුළ නිමකිරීමට නොහැකිවීම හේතුවෙන් ව්‍යාපෘති කාලය 2019 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් 2020 මැයි විගණන දින වන විට රු 711,891 ක පිරිවැයක් දරා තිබුණ ද මෙම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. | මෙම යන්ත්‍රය නිපදවනු ලබන්නේ පරීක්ෂණ කටයුතු ද ඇතුළත්වය. මෙම ක්‍රියාවලියේදි බලාපොරොත්තු නොවූ තාක්ෂණික ගැටළු මතු වූ අතර මේ වන විට ඒවා නිවැරදි කර ගනිමින් සිටියි. යන්ත්‍රයේ සියලුම ප්‍රධාන කොටස් නිමවා ඇත. යන්ත්‍රයේ නියමු මට්ටමට ක්‍රියා කිරීම තහවුරු කර ගැනීමෙන් පසු එය භාරදී ඉතිරි මුදල් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. | ව්‍යාපෘතිය සඳහා කාලය තීරණය කිරීමේදි ප්‍රායෝගික තත්වයන් සැලකිල්ලට ගෙන තාත්වික කාලයක් ව්‍යාපෘති නිමකිරිම සඳහා ලබාදිය යුතු බව හා ව්‍යාපාති කඩිනමින් නිමකිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව. |
| (ආ) | 2014 - 2019 කාලපරිච්ඡේදයේ දී හඳුන්වා දුන් තාක්ෂණයන් 28 න් පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම්කර තිබුණේ පිරිවැය රු. 1,920,465 ක් වූ තාක්ෂණයන් 02 ක් සඳහා පමණි. | පේටන්ට් බලපත්‍ර ලබාගැනීම සෑම තාක්ෂණයකටම කළ නොහැක. මේ අනුව පේටන්ට් බලපත්‍ර ලබාගැනීමට දැනට තාක්ෂණයන් හතරක් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරණ ලදී. තවත් තාක්ෂණයන් සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | හඳුනාගත් නව තාක්ෂණයන් සඳහා කඩිනමින් පේටන්ට් ලබා ගත යුතුය. |
| (ඇ) | ඇස්තමේන්තුගත වියදම රු 25,845,838 ක් වූ Advance of NERDC cremator for Environmental performance ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් 20 දිනැති ගිවිසුම ප්‍රකාරව මාස 07 කින් වැඩ නිම කිරීමට නියමිතව තිබුණතද 2019 ජූලි 01 සංශෝධිත ගිවිසුම ප්‍රකාරව 2019 සැප්තැම්බර් 30 දක්වා දින දිර්ඝ කර තිබුණි. එසේ වුවත් එම දිනටම ව්‍යාපෘති කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී නොතිබුණි. | ආදාහනාගාරයේ වැඩ කටයුතු වල අඩුපාඩු (ආදාහනයකට යොදන L.P. වායු කිලෝ ප්‍රමාණය අඩු කිරීම, ආදාහනාගාර දොරටුවේ ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම) බලාපොරෝත්තු වුව ද විදේශීය සැපයුම්කරුවන්ගෙන් ලබා ගත නොහැකි අයිතම නැවත ටෙන්ඩර් කිරීමට සිදු වීම ප්‍රමාදයට හේතු වුවත් ව්‍යාපෘතිය නිම කර ඇතත් නගර සභාව මෙතෙක් භාර ගෙන නැති අතර මුදල් ලැබීමට නියමිතයි. | ව්‍යාපෘතිය සඳහා කාලය තීරණය කිරීමේ දී ප්‍රායෝගික තත්වයන් සැලකිල්ලට ගෙන තාත්වික කාලයක් ව්‍යාපෘති නිම කිරීම සඳහා ලබා දිය යුතු බව හා ව්‍යාපෘති කඩිනමින් නිමකිරිමට අවශ්‍ය කටයුතු කලයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **2018** ජනවාරි **01** දින ආරම්භ කර වසරකින් අවසන් කල යුතු මෙම Smart pet bottle crushing machine උපකරණය රු.**700,000** කට ඇස්තමේන්තු කලද දැනට රු .**1,053,007** ක වියදමක් දරා තිබුණි. **2020** මාර්තු **31** දක්වා දින දිර්ස කර තිබුණ ද මෙහි භෞතික ප්‍රගතිය සියයට **63** ක් පමණ විය. | ව්‍යාපෘතියේ කටයුතු අලුත් ඉංජිනේරුවකු යටතේ නැවත ආරම්භ කිරීම හා අමතර කොටස් මිලදී ගැනීමේ අපහසුතාවය මත ප්‍රමාද විය. මූලික එකලස් කිරීමේ කටයුතු හා විද්‍යුත් පද්ධති ක්‍රම ලේඛනය කිරීමේ කටයුතු දැනට සිදු කර ගෙන යනු ලබයි. | ව්‍යාපෘතිය සඳහා කාලය තීරණය කිරීමේ දී ප්‍රායෝගික තත්වයන් සැලකිල්ලට ගෙන තාත්වික කාලයක් ව්‍යාපෘති නිම කිරීම සඳහා ලබා දිය යුතු අතර ව්‍යාපෘති කඩිනමින් නිමකිරිමට අවශ්‍ය කටයුතු කල යුතුය. |
| (ඉ) | මාස **3** කින් වැඩ නිමකිරීමට **2015** අප්‍රේල් **27** දින ආරම්භ කළ Development of a Device to measure Surface moisture of Green Tea Leaves ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු මුදල රු **170,000** ක් වුවද **2020** මැයි වන විට රු.**345,042** ක වියදමක් දරා අවස්ථා **11** කදී දින දීර්ස කිරීම් ලබා ගන්තත් **2020** වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. | අවසාන මූලාකෘතිය ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා යොමු කොට තිබෙන අතර එය නැවත ලබා ගැනීමෙන් පසු නිරීක්ෂණය වූ උත්ශ්‍රේණි කිරීම් සිදු කොට වෙළඳපලට සුදුසු ආකාරයේ උපකරණයක් ලෙස පර්යේෂණ අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | අදාල කාලය තුළ පර්යේෂණ කටයුතු කර ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කල යුතු බව. |
| (ඊ) | **2017** ජනවාරි මස ආරම්භ කර **2018** අගෝස්තු මස **31** අවසන් කිරීමට සැලසුම් කර රු.**960,000** ඇස්තමේන්තු කර අවස්ථා **05** ක් දින දිර්ස කිරීම් ලබා ගෙන **2020** අප්‍රේල් **30** දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. | පරිපථ නැවත නැවත සැලසුම් කරමින් පර්යේෂණය නැවත මුලික අවස්ථාවට යොමු කිරීමටත්, මිලදී ගැනීම් සිදු කිරීමටත් පර්යේෂණ ක්‍රමවේදයන්ගේ විචලයත්වය හේතු කොට ගෙන ප්‍රමාදයන් සිදු විය. | ව්‍යාපෘති කඩිනමින් නිමකිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |